ඔබ වචනයක් පවසා සිටියෙහිය. මුහුදු ජලය සමග එය මුසු වූයේ නම්, එය මිශ්ර වී දූෂිත වනු ඇත

මුඃමින්වරුන්ගේ මාතාව වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට: ඔබට සෆිය්යා මේ මේ අයුරින් ප්රමාණවත් - එක් වාර්තාකරුවකු පවසා සිටියේ - ඈ කොට තැනැත්තියක් යැයි එයින් අදහස්
කළ බවයි. එවිට එතුමාණෝ "ඔබ වචනයක් පවසා සිටියෙහිය. මුහුදු ජලය සමග එය මුසු වූයේ
නම්, එය මිශ්ර වී දූෂිත වනු ඇත. ඇය මෙසේ පවසා සිටියාය: "මම පවසා සිටියේ මිනිසකු පවසා සිටින අයුරිනි". එවිට එතුමාණෝ, "සැබැවින්ම මට මේ මේ තිබුණ ද මිනසාගේ අඩුපාඩු
කතා කිරීම මම ප්රිය නොකරමි" යැයි පවසා සිටියහ. [صحيح] [رواه أبو داود والترمذي وأحمد]

මුඃමින්වරුන්ගේ මාතාවක වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට: ඔබට සෆිය්යා ප්රමාණවත් - ඇය ඉන් අදහස් කළේ - ඇගේ ශරීරයේ අඩුපාඩුකම් අතර ඇය කොට තැනැත්තියක් වූ බවයි. එවිට එතුමාණෝ "ඔබ වචනයක් පිට කළෙහිය. මුහුදු ජලය සමග එය මුසු වූයේ නම්, එය ඉක්මවා ගොස් එය වෙනස් කර දූෂිත කරනු ඇත." යැයි පැවසුහ. ඇය මෙසේ පවසා සිටියාය: "මම එසේ සිදු කළේ (පොදුවේ) මිනිසා හෑල්ලු කර ක්රියා කරන ආකාරයෙනි." එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: "ඔහුට කවර ආකාරයේ අඩුපාඩුවක් තිබුණ ද ඊට වඩා කොපමණ අධික ප්රමාණයක් මෙලොවෙහි මට පිරිනමා තිබුණ ද ඔහුගේ අඩුපාඩු කතා කිරීම හෝ ඔහුව අනුකරණය කර කතා කිරීම හෝ ඔහු සිදුකරන්නාක් මෙන් මා ද සිදු කිරීම හෝ ඔහු ප්රකාශ කරන්නාක් මෙන් මා ද ප්රකාශ කිරම හෝ මා ප්රිය කරවන්නක් නොවේ." යැයි පැවසුහ.

https://sunnah.global/hadeeth/si/show/3705